පුරවැසි ජනමාධ්‍ය වැඩසටහන
මාධ්‍ය ඒකකය
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
සිව්වන කලාපය
ඔක්තෝබර් 2007

vikalpa
විකල්ප
மாற்று வழி

# පුරවැසි මාධ්‍යවේදියෝ බුරුමයේ මිලිටරි පවුරු බිඳ දමති...

පසුගිය මාසය පුරා බුරුමයේ ඇති වූ දැවැන්ත මහජන නැගිටීම සහ මිලිටරි ජුන්ටාවේ සාහසික ජන මර්දනය වාර්තාකරණයේදී පුරවැසි වාර්තාකරුවන් ලබා දුන් අභීත දායකත්වයත් සමගම, පුරවැසි ජනමාධ්‍යයට ඇති කළ හැකි බලපෑමේ තරම පිළිබඳ ලෝකය අලුතෙන් සිතන්නට පටන් ගෙන තිබේ. සැබවින්ම පුරවැසි ජනමාධ්‍යවේදයේ සැබෑ මෙහෙවර පිළිබඳ අලුතෙන් නිර්වචන ලබා දෙන්නට පවා ඇතැමුන් ඉදිරිපත් වී තිබේ.


කෙන්ජි නගායි මාධ්‍යවේදියාට වෙඩි තබන අයුරු

මේ හා සමානම දැවැන්ත ජන උද්ඝෝෂණයක් 1988 වසරේදීත් බුරුමයේ ඇතිවිය. 3000ට අධික පිරිසක් ඒ අරගලයේදී මරා දමුණි. නමුත් ඒ වතාවේදී සියලුම ජාත්‍යන්තර මාධ්‍යවලට දොර වසා දැමූ මිලිටරි පාලකයෝ වීදි දිගේ ගලා ගිය ලේ දහරා සැඟෙන දුරකට ලෝකයාගෙන් වසන් කිරීමට සමත් වූහ. එදා මෙදා තුර දශක දෙකකට ආසන්න කාලයක් තුළදී නව සන්නිවේදන තාක්ෂණයේ ඇති වී ඇති දියුණුව අති විශාලය. දරුණුතම ෆැසිස්ට්වාදී පාලකයන්ට පවා තොරතුරු හුවමාරුව නතර කිරීම දුෂ්කර විය. අන්තර්ජාලයේ වෙබ් අඩවි සහ කැමරා සහිත ජංගම දුරකතන හරහා බුරුමයේ සිදුවීම් පිළිබඳ ප්‍රවෘත්ති සහ වීඩියෝ දර්ශනත්, ඡායාරූපත් අතොරක් නැතිව ජාත්‍යන්තර මාධ්‍ය ආයතන වෙත ලැබෙන්නට විය. මේ නිසා බුරුමයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී හමුදා පාලනයට එරෙහිව අති ප්‍රබල ජාත්‍යන්තර මතයක් ගොඩ නැඟීමට අවස්ථාව උදා විය. එසේම මෙතුවක් චීනය ඇතුළු බුරුම මිලිටරි ජුන්ටාවේ පැවැත්ම සඳහා ආධාර කළ රාජ්‍යයන්ට ද එරෙහිව විශාල බලපෑමක් කරන්නට හැකි වූයේ, බුරුම පාලකයන්ගේ දුර්දාන්ත ක්‍රියා, පුරවැසි වාර්තාකරුවන් හරහා ලෝකයට හෙළිදරව්වූ නිසාවෙනි.


උද්ඝෝෂකයන්ට හමුදා ප්‍රහාර

පුරවැසි ජනමාධ්‍යයට වෘත්තීය ජනමාධ්‍යවේදයේ සීමාවන් අභිභවා යා හැකි බවත්, දැඩි වාරණ පනවා ඇති අවස්ථාවකදී පවා, තහංචි අතරින් රිංගා ලෝකයට සත්‍ය විදහා පෑ හැකි බවත් බුරුමයේ සිදුවීම් සමග මොනවට ඔප්පු වී ඇත. බුරුම රජය බොහෝ විදේශීය මාධ්‍යවේදීන්ට රට තුළට පැමිණීමට ඉඩ නොදී මුරකාවල් දැමීය. එහෙයින් ඒ මාධ්‍යකරුවන්ට බුරුමයේ තතු වාර්තා කරන්නට සිදු වූයේ ඉන්දියාවේ හෝ තායිලන්තයේ රැඳෙමිනි. ඔවුන්ගේත් ප්‍රධානතම ප්‍රවෘත්ති මූලාශ්‍රය බවට පත් වූයේ යැන්ගොන් (පෙරදී රැන්ගූන් ලෙස හඳුන්වන ලද බුරුම අගනුවර) හි වීදි දිගේ විරෝධතා පෙළපාලිවල දහස් ගණනක් වූ උද්ඝෝෂකයන් අතර රැඳෙමින්ම පුරවැසි වාර්තාකරුවන් විසින් එවූ කෙටි පණිවුඩ sms සහ වීඩියෝ දර්ශන හෝ නිශ්චල ඡායාරූපයි.


හමුදා පෙළපාලි කරුවන්ට පහර දෙමින්

කෙන්ජි නගායි නම් වන ජපන් ජාතික ඡායාරූප මාධ්‍යවේදියාට බුරුම හමුදාකරුවෙකු විසින් වෙඩි තබන අයුරු පුරවැසි වාර්තාකරුවෙකු විසින් වීඩියෝ ගත කර ලොවට බෙදා හැර තිබේ. ඔහුගේ ඝාතනය පිළිබඳ මේ දර්ශන ජපන් රූපවාහිනියේ විකාශය කළ අතර YouTube වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත. නගායි මාධ්‍යවේදියා මිය ගියේ ඔහු වෙතට එල්ල කළ උණ්ඩයකින් නොවන බව කියමින් බුරුම රජය කළ සීතල ප්‍රකාශයන්ගේ වලංගුභාවය මේ දර්ශන අනාවරණය වීමත් සමගම විශාල වශයෙන් ප්‍රශ්න කිරීමකට ලක් විය. හමුදා භටයින් දහස්ගණන් බෞද්ධ භික්ෂු භික්ෂුණීන්ට ම්ලේච්ඡ සහගත ලෙස පොලු මුගුරුවලින් පහර දෙන ආකාරය දක්වෙන ඡායාරූප සහ වීඩියෝ දර්ශන ද අතොරක් නැතිව බුරුමයෙන් පිට සිට ක්‍රියාත්මක වූ මාධ්‍ය සහ සිවිල් සංවිධාන වෙත ලැබෙන්නට විය. මේවා එව්වේ කවුරුන්දැයි ඒවා පළ කළ වෙබ් අඩවි වල සංස්කාරකවරුන් දැන සිටියේ නැත.

මේ වන විට මිලිටරි පාලනය විසින් බුරුම ජන අරගලය මර්දනය කොට ජනතාව නිහඬ කර තිබේ. නමුත් මේ නිහඬතාව කොතෙක් කල් පවතීද යන්න අවිනිශ්චිතය. කෙසේ හෝ බුරුමයේ දැඩි අන්තර්ජාල පාලනයක්ද පනවා තිබේ. අන්තර්ජාල සම්බන්ධතා අවහිර කොට, වෙබ් අඩවි වලට පිවිසිය හැකි මං වසා දමා තිබේ. ජංගම දුරකථන උදුරාගෙන රජය යටතට ගෙන තිබේ.  කෙසේ වෙතත් බුරුම ක්‍රියාකාරීහු වෙනත් අන්තර්ජාතික සංවිධාන සමග එක්ව රජයේ බාධක පරයා අන්තර්ජාලය හරහා තොරතුරු බෙදාහැරිය හැකි නව තාක්ෂණික විධීන් මොනවාදැයි සොයා බලමින් සිටින අතර, ඒ සඳහා අවශ්‍ය වන අරමුදල් සොයා ගැනීමට අරමුදල් එකතු කිරීමේ ව්‍යාපාරයක්ද දියත් කොට තිබේ.

බුරුම අරගලය හා බැඳුණු වීඩියෝ සහ ඡායාරූපත්, ප්‍රවෘත්තිත් ලබා ගත හැකි බ්ලොග්ස් සහ වෙබ් අඩවි කිහිපයක් පහතදැක්වේ.

Mizzima News, The Irawaddy, Democratic Voice of Burma, Justice and Injustice
http://soneseayar.blogspot.com, http://mmedwatch.blogspot.com, http://ko-htike.blogspot.com,
http://mogokmedia.blogspot.com, Today Burma, Youtube

---

# පුරවැසි ජනමාධ්‍ය වැඩමුළු තුනක් කොළඹ, කුරුණෑගල සහ බදුල්ලේ...

පුරවැසි ජනමාධ්‍ය භාවිතය ලංකාව තුළ ජනප්‍රිය කරවීමේ අරමුණ ඇතුව රටේ විවිධ ප්‍රදේශවල පැවැත්වෙන එක්දින වැඩමුළු මාලාවේ තෙවන, සිවුවන සහ පස්වන වැඩමුළු පිළිවෙළින් ඔක්තොබර් 16, 18 සහ 20 යන දිනවලදී බදුල්ල, කොළඹ සහ කුරුණෑගලදී පවැත්විණි. ඒ වැඩමුළුවලදී සහභාගි වූවන් විසින් ලියන ලද පුරවැසි කතා කිහිපයක් මෙහි දැක්වෙයි.



*කොළඹ වැඩමුළුව පැවැත්වෙන අතරතුරදී*

## ප්‍රයිවට් බස් මාෆියාව

ගිය සතියේ දිනයක දෙමටගොඩ යෑම සඳහා බම්බලපිටියෙන් අඟුලාන- කිරිබත්ගොඩ 154 බසයට ගොඩවීම සඳහා අසල බස් නැවතුම්පළට ගියෙමි. එවිට ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් 154 බසයක් හා පෞද්ගලික බසයක් පැමිණියේය. මම ලංගම බස් රථයට නැංගෙමි.

ගමන ආරම්භයේ සිටම ඊළඟ බස් නැවතුම්පළ දක්වාම මා ගමන් කළ ලංගම බස් රථය ඉහත කී පුද්ගලික බස් රථයට පිටුපසින් හෙමින් ගමන් කළේය. කිසිවිටෙකත් අපේ බස් රථය අපට ඉදිරියෙන් ගිය පුද්ගලික බස් රිය අභිභවා ධාවනය කළේ නැත.  ලංකාවේ සාමාන්‍ය බස් සේවාව ගැන වැටහීමකින් සිටි මා හට මෙම රියදුරාගේ ක්‍රියා කලාපය පුදුමය ගෙන දෙන්නක් විය.

මේ අයුරින් මා ගමන් ගත් බස් රථය මගීන් නංවා ගැනීම සඳහා මීළඟ බස් නැවතුම් පොළේ නතර කළේය. එහිදීද අපගේ බස් රථයට ඉදිරියෙන් ඉහත පුද්ගලික බසය නතර කෙරිණි. ඉක්බිතිව පුද්ගලික බස් රියේ කොන්දොස්තර මා ගමන් ගත් ලංගම බස් රියේ රියදුරා ළඟට පැමිණ තම ඇඟිලි තුඩුවල රඳවාගෙන සිටි රුපියල් 100 නෝට්ටු කීපයක් ඉතා සුහදව අපේ රියදුරු වෙත ලබා දුන්නේය.

***නිශාන්ත ප්‍රීතිරාජ් / කොළඹ වැඩමුළුව***

# අපි පත්තරෙන්

මගේ මාමා කොළඹ පත්තර කන්තෝරුවක පත්තර වෑන් එකේ ඩ්‍රයිවර් විදියට වැඩ කරනවා. එයා දෙමළ. ඒත් එයාට සිංහලත් කතා කරන්න පුළුවන්. එයාගේ අත් උදව්වට වෑන් එකේ යන අනිත් එක්කෙනාත් දෙමළ. හැබැයි එයාට සිංහල තේරෙන්නෙ නෑ.

එක දවසක් උදේ මේ දෙන්නා පත්තර වෑන් එකේ යන කොට කොළඹ දී චෙක් පොයින්ට් එකක හමුදාවෙන් අත දාලා වාහනේ නැවැත්තුවා. මාමා අයි ඩී එකයි ලයිසන් ඉන්ෂුවරන්ස් කොළයි අරගෙන වෑන් එකෙන් බැහැලා හමුදා නිලධාරියා ළඟට ගියා. මාමාගේ ගෝලයත් එත් එක්කම අයිඩෙන්ටිය දික්කරගෙන වාහනෙන් බැස්සා.

''ඕගොල්ලං කොහෙද?'' සැක සහිත බැල්මක් දාගෙන හමුදා නිලධාරියා සැරෙන් ඇහුවා.

'' පත්තරෙන් සර්..''

එකපාරටම ගෝලයා කලබල වෙලා,

''පත්තරෙ ඉල්ලෙ... ඒළු අර...'' කිව්වා.

'' නීංග කොංජම් ඉරුංග..''  ( පොඩ්ඩක් ඉන්ඩ ) කියලා මාමා එයාට කිව්වා.

හමුදා නිලධාරියාගේ සැකේ වැඩි වුණා.

''මොනවද තමුසෙලා කතාකරන්නේ..ආ..'' හමුදා නිලධාරියා මාමගෙන් සැර වැඩි කරලා ඇහුවා.

''නෑ සර් එයාට සිංහල දන්නෑ...මම පත්තරෙන් කිව්වම එයා හිතුවේ මම කියන්නෙ වෙලාව කියලා. දෙමළෙන් පත්තරෙ කියන්නෙ දහයාමාරට. එයා කිව්වෙ වෙලාව දහයාමාර නෙමෙයි හතාමාර කියලා. දැන් වෙලාව හතාමාරයිනෙ සර්...''

***සුගන්ධි මනිමාරන්***
*කොළඹ වැඩමුළුව*

# පුරවැසි ජනමාධ්‍ය සම්මාන



එංගලන්තයේ Press Gazzette සඟරාව මගින් සංවිධානය කරනු ලබන Nokia පුරවැසි ජනමාධ්‍ය සම්මාන උළෙල 2006 වසරේදී ප්‍රථම වරට පැවැත්විණ. එහිදී පුරවැසි වාර්තාකරුවන් විසින් වෙබ් අඩවි වලට යැවූ ඡායාරූප අතුරෙන් හොඳම ඡායාරූප සහ වීඩියෝ වාර්තා තෝරා ත්‍යාග පිරිනමනු ලැබිණි. මේ දැක්වෙන්නේ එහිදී පළමු ස්ථානය දිනාගත් ඡායාරූපයයි. එය 2005 ජූලි 7 වන දින  ලන්ඩනයේ බස් රියක සිදුවූ බෝම්බ පිපිරුමෙන් තත්පර කිහිපයකට පසු ඒ අසලින් ගමන් ගත් පුරවැසි වාර්තාකරුවෙකු සිය අතෙහි වූ ජංගම කැමරා දුරකතනයෙන් ගත් ඡායාරූපයකි.

මේ තරඟය පිළිබඳ විස්තර පහත වෙබ් අඩවියෙන් ලබා ගත හැකියි.
**http://www.citizenjournalismawards.com/**

## දැන් විකල්ප නමින් Youtube වීඩියෝ චැනලයක්

විකල්ප සංස්කාරක කණ්ඩායම විසින් Youtube හි පළ කරන වීඩියෝ දර්ශන වාර්තා එකට ගොනු කර vikalpasl නමින් විකල්ප වෙනුවෙන්ම වූ චැනලයක් ආරම්භ කර තිබේ. විකල්ප හරහා Youtube හි පළ වන සියලුම වීඩියෝ දර්ශන මේ හරහා එකම තැනකින් පහසුවෙන් ලබා ගත හැකියි.

**http://www.youtube.com/vikalpasl/**




## අපිත් වෙනසක් කළ හැකිදැයි බලමු.......

**'විකල්ප' පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවියට ලියමු.**

සාමය, මානව අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය....ආදී පුළුල් ක්ෂේත්‍රවලට අදාලව එදිනෙදා ජීවිතයේදී ඔබ අහන, දකින, අත්විඳින, අනෙකා සමඟ කතා බහ කළ යුතුයැයි හැඟෙන සිදුවීම් පිළිබඳව කෙටියෙන් ලියා විකල්ප වෙත එවන්න. ඔබේම පුරවැසි සටහන් පළ කරනවාට අමතරව වෙනත් අය එවා ඇති සටහන් වලට ප්‍රතිචාර දක්වීමත් ඔබට කළ හැකියි. ඒ හරහා සජීවී සාකච්ඡාවකට මුලපිරිය හැකියි.

සිංහලෙන් හෝ දෙමළෙන් ඔබගේ කතාව විකල්ප වෙත ලියන්න.

**විකල්ප ඊ බුලටිනය පිළිබඳව ඔබගේ ප්‍රතිචාරය අපට ලබා දෙන්නේ නම් එය අපේ අනාගත ප්‍රකාශනවල ගුණය වැඩි දියුණු කර ගැනීමට පිටිවහලක් වනු ඇත. කරුණාකර මිනිත්තු කිහිපයක් මිඩංගු කර පහත සම්බන්ධකය හරහා ගොස් අපගේ ප්‍රශ්න කිහිපයට ඔබගේ ප්‍රතිචාරය සටහන් කරන්න.**

http://tinyurl.com/33wtzc

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

පුරවැසි ජනමාධ්‍ය වැඩසටහන

මාධ්‍ය ඒකකය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 1 සී, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ - 07
දුරකථන අංක : 011-2375269, 011-2375012, ෆැක්ස් අංකය : 011-2375623
contributions@vikalpa.org, editor@vikalpa.org, info@vikalpa.org